# පුරාතන සහ නූතන අධ්‍යාපන රටාවන්හි දී පාලි භාෂාවට හිමි ස්ථානය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

පිටබැද්දර සිරිනිග්‍රෝධ හිමි

## හැඳින්වීම

දුරාතීතයේ ලංකාවේ පැවති අධ්‍යාපන ක්‍රමය යනු බෞද්ධ ආරාම මුල්කරගත් වූවකි. බුදුන් වහන්සේගේ අධ්‍යාපන සම්ප්‍රදය යනු පුද්ගලයා මෙන්ම තමා ජීවත්වන ලෝකය පිළිබඳව ද පරිපූර්ණ වූ අධ්‍යාපනයක් ලබා දෙන ඉගැන්වීමකි. පස්වග මහණුන්ගෙන් ආරම්භ වූ මෙම අධ්‍යාපන ක්‍රමවේදය භාරතයේ ද විවිධ භික්ෂු ආරාම වල දියුණු වී විදේශ රටවල ද ව්‍යාප්ත විය. ලක්දිව ආරාමික අධ්‍යාපනය ආරම්භ වූයේ දේවානම්පියතිස්ස රජු සමයේ දී විශාල පිරිසක් බුදුසමය වැළඳ බුදුසසුනේ පැවිදි වීමත් සමග ය. මෙම පිරිස ව්‍යක්ත, විශාරද, පැවිදි භික්ෂූන් යටතේ පුළුල්ව බුද්ධ ධර්මය ද භාෂා ද උගත්තෝය. පුරාතන අධ්‍යාපන ක්‍රමවේදය තුළ ශිෂ්‍යයා ගුරුවරයා සමීපයේ සිට අධ්‍යාපනය ලැබූ බව පෙනේ. විවිධ වූ ප්‍රදේශවලට ව්‍යාප්ත වූ මෙම අධ්‍යාපනය තුළින් බොහෝ ආරාම ද ස්ථාපිත විය. ඉසුරුමුණිය, තිස්සමහාරාමය, දඹකොළ වෙහෙර ආදි ආරාම නිදසුන් ලෙස පෙන්වා දිය හැකිය. මහා විහාරය ථේරවාදීන්ගේ ප්‍රධාන ගුරුකුලය වූ අතර පසු කාලයේ දී එය ලෝකයේ මහත් කීර්තියට පත් අධ්‍යාපනික මධ්‍යස්ථානය එනම් විශ්වවිද්‍යාලයක් ලෙස දියුණු විය. පුරාතන අධ්‍යාපනයෙහි සාර්ථක ගුරු ගෝල සම්බන්ධතාවයක් තිබු බව පැහැදිලි වන අතර ශිෂ්‍යයා දැනුමින් පමණක් නොව කුසලතා ආකල්පවලින් සන්නද්ධ කරවීමට මෙම අධ්‍යාපන ක්‍රමය බෙහෙවින් ඉවහල් විය. නූතන අධ්‍යාපන ක්‍රමවේදය තුළ ශිෂ්‍යයා ගුරුවරයා වෙත ගොස් අධ්‍යාපනය ලැබීම සහ ගුරුවරයා ශිෂ්‍යයා වෙත පැමිණ අධ්‍යාපනය ලබාදීම යන කාරණා දෙකම සිදුවේ. තාක්ෂණය මූලික කරගනිමින් ඉතා වේගවත් අධ්‍යාපන රටාවක් නූතන අධ්‍යාපනයේ දී දැකගත හැකි ය. වේගවත් අධ්‍යාපනය තුළ රැකියාවන් සොයායාමේ අරමුණින් අධ්‍යාපන කටයුතු සිදු වේ. එම වේගවත් අධ්‍යාපනයේ දී ශිෂ්‍යයා ලබන දැනුම පුළුල් නොවීමට හේතුවන්නේ සිසුවාට අධ්‍යාපනයෙහි ගුණාත්මක හා සාරවත් අධ්‍යයන පරිසරය මග හැරීම යි. පුරාතන අධ්‍යාපන ක්‍රමවේදය තවමත් නූතන අධ්‍යාපනයේ ද දක්නට තිබේ. එනමුත් නූතනයේ සමහර ස්ථානවල අධ්‍යාපනික ක්‍රමවේදයේ අඩුපාඩු දක්නට තිබේ. නූතනයේ විභාග මූලික කරගනිමින් අධ්‍යාපන කටයුතු සිදු කෙරේ. එහෙත් ආකල්පමය අඩුවක් නූතන පරපුරේ දක්නට ලැබේ. පුරාතන අධ්‍යාපනයේ දී ශික්ෂණය ලබාදීමේ ක්‍රමවේදයක් තිබූ අතර නූතනයේ සමහර අවස්ථාවල මුදල් ම පමණක් බලාපොරොත්තු වී ශිෂ්‍යයා ශික්ෂණය කිරීමට උත්සාහ කිරීමක් ගුරුවරයා තුළ දක්නට නොමැත. එහෙත් ආරාම තුළ ද අද දක්වා පුළුල් සාර්ථක අධ්‍යාපන ක්‍රමවේද අනුගමනය කරන බව පෙනේ. නූතන අධ්‍යාපන ක්‍රමවේදය තුළ ශිෂ්‍යයා තුළ ආකල්පමය දියුණුවක් සිදු නොවීම තුළින් ගුණධර්මවල අඩුවක් දක්නට ලැබේ. එසේ වන්නේ නූතනයේ දී ගුරුවරයා සමීපයේ

නොව පරිගණකය ආදී තාක්ෂණික උපකරණ භාවිත කරමින් ශිෂ්‍යයා අධ්‍යයන කටයුතුවල නිරත වීම යි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම ශාස්ත්‍රීය පර්යේෂණය සිදු කිරීමේ දී තොරතුරු ලබාගැනීම පිණිස අනුග මනය කරන පර්යේෂණ ක්‍රමවේදය වන්නේ සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යනය යි. ප්‍රාථමික මූලාශ්‍රය මෙන්ම මූලාශ්‍රය යටතේ පාලි ග්‍රන්ථ උපයෝගී කරගනිමින් ද අධ්‍යයනය සිදු කෙරේ. එමෙන් ම විදේශයන්හි පාලි භාෂාවට හිමි තැන ද පෙන්වා දෙමින් අධ්‍යයන සිදු කර අවසන් නිගමනය කරා එළඹ ඇත.

**පර්යේෂණයේ අරමුණ හා වැදගත්කම**

පුරාතන හා නූතන අධ්‍යාපන ව්‍යුහය හඳුනාගැනීම ප්‍රධාන අරමුණ වේ. වර්තමානයේ අධ්‍යාපනය පිළිබඳව හඳුනාගැනීම මෙන්ම පුරාතන ආරාමික අධ්‍යාපනය පිළිබඳ අඩු අවධානයක් යොමු වන බැවින් ඒ පිළිබඳව අධ්‍යයනය කිරීම කාලානුරූපීව වැදගත් වේ.

**පර්යේෂණ ගැටලුව**

පුරාතන සහ නූතන අධ්‍යාපන ව්‍යුහය කෙසේ පැවතියේ ද යන්න පිළිබදව හා එම අධ්‍යාපන රටාව තුළින් පුද්ගලයාට සහ සමාජ සංවර්ධනයට මෙන්ම පාලි භාෂාවට හිමි ස්ථානය මෙහි දී විමර්ශනයට ලක් කෙරේ.

**පර්යේෂණ සාකච්ඡාව**

පුරාතන හා නූතන අධ්‍යාපනයේ දී දැනුම ලබා දීම මූලික අරමුණ වේ. භික්ෂූන් වහන්සේ ප්‍රධාන වශයෙන් ආරාමවල ඉගෙනීමේ හා ඉගැන්වීමේ ක්‍රියාවලියේ නිරත වූහ. පසු කාලයේ දී අධ්‍යාපන විෂය මාලාවට වෙනත් බොහෝ විෂයයන් ද ඇතුළත් වීමත් සමගම බුද්ධවචනය පාලියෙන් අධ්‍යයනය කිරීම පමණක් නොව භාෂා ශාස්ත්‍ර දර්ශන හා ශිල්ප කර්මාන්ත දැනුම ලබාදීම ද පුරාතන අධ්‍යාපනයේ මූලික අරමුණක් විය. ආකල්ප සංවර්ධනය සහ සදාචාර සම්පන්න පුද්ගලයෙකු බිහිකිරීම ගුරුවරුන් තමන්ගේ ප්‍රධාන යුතුකම ලෙස සැලකීය. කුසලතා සංවර්ධනය ද පාලි භාෂාව ව්‍යාප්ත කිරීම පුරාතන හා නූතන අධ්‍යාපනයේ මූලික වගකීමකි.

**නිගමනය**

අධ්‍යාපන රටාව තුළ පාලි භාෂාවට සුවිශේෂී ස්ථානයක් පැවති අතර පුද්ගල ජීවිතයට පාලි භාෂාව බද්ධ වී තිබේ. නූතනයේ වේගවත් අධ්‍යාපන රටාව තුළ අවිවේකී බව නිසා පුද්ගලයා තුළ ආකල්පමය අඩුවක් දැකිය හැකි අතර නූතන වේගවත් අධ්‍යාපන රටාව මඟින් පාලි භාෂාවට විවිධ රටවල පවා ගෞරවනීය ස්ථානයක් හිමි කර දීමට හැකි වී තිබේ.

**ප්‍රමුඛ පද:** නූතන අධ්‍යාපනය, පුරාතන අධ්‍යාපනය, ගුරුවරයා, ශිෂ්‍යයා, පාලි භාෂාව

## ආශ්‍රිත ග්‍රන්ථ


පාලි භාෂාව ගුරුඅත් පොත (මූලික පිරිවෙන්)

අබේසිංහ වික්‍රමනායක (1999), පැරණි ශ්‍රී ලංකාවේ ආරාම අධ්‍යාපනය, නුගේගොඩ, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්.

ඤාණවීර හිමි,රනස්ගල්ලේ (2007), ඤාණාඤ්ජලී , නුගේගොඩ, පියසිරි ප්‍රින්ටින්.

ධම්මතිලක හිමි පැලවත්තේ, (1999), බෞද්ධ අධ්‍යාපනය, කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.